මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் மතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| නර්තනය | 9 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

**ශිෂ්‍යයාගේ නම :-** ..........................................................................................................................

### I කොටස

- ❖ සැලකිය යුතුයි.
- ❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

- අංක 1 සිට 5 තෙක් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.

01. අදහස් ප්‍රකාශනයේදී අංග, ප්‍රත්‍යාංග , උපාංග යන්නෙන් අදහස් ප්‍රකාශ වීම,

1. ආංගික අභිනයයි  2. සාත්වික අභිනයයි
3. ආහාර්ය අභිනයයි  4. වාචික අභිනයයි

02. තම්මැට්ටම හඳුන්වන වෙනත් නමකි.

1. දෙවොල් බෙරය  2. පොකුරු බෙරය
3. මඟුල් බෙරය  4. දඬු බෙරය

03. මාත්‍රා 3/3 තාල රූපය හඳුන්වන්නේ,

1.මැදුම් තනි තිත  2. සුළු මැදුම් දෙතිත
3. සුළු තනි තිත  4. මහ තනි තිත

04. කාන්තාවන් සඳහා වඩාත් සුදුසු දේශීය ගැමි නැටුමක් ලෙස,

1. ලී කෙලි නැටුම  2. තාලම් නැටුම
3. කළ ගෙඩි නැටුම  4. කාවඩි නැටුම හඳුන්වාදිය හැකිය

05. මහනුවර දළදා පෙරහැර අවසානයේ සිදුකරනු ලබන සුවිශේෂී චාරිත්‍රයකි.

1. කප් සිටුවීම  2. දිය කැපීම
3. දිග්ගෙයි නැටුම  4. මුරුතැන් පිදීම

- අංක 6 සිට 10 තෙක් ප්‍රකාශ හරිනම් (√) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද හිස්තැන මත ලියන්න.

06. සබරගමු නර්තනය සඳහා සොෂක බෙරය භාවිතා කරයි. (     )
07. ග්‍රහ පන්ති කවි ගායනයේදී අත්මිණිය යොදාගනී. (     )
08. රජුගේ පණිවිඩ ජනතාව අතරට රැගෙන යාම සඳහා අතීතයේදී තම්මැට්ටම යොදාගෙන ඇත. (     )
09. දිසා තල භාවිතා කරමින් පුද්ගල අවකාශය තුල අලංකාර නර්තන නිර්මාණයක් බිහිකළ හැකි වේ. (     )
10. චරිත නිරූපණයේදී "භාව ප්‍රකාශනය" වැදගත් වේ. (     )

- සුදුසු වචන යොදා ප්‍රහේළිකාව පුරවන්න.

| | | | | |
|---|---|---|---|---|
| 11 ය | | 15 බෙ | | 16 ය |
| ■ | ■ | | ■ | ■ |
| 12 ක | | | ■ | ■ |
| ■ | ■ | 13 ර | | ■ |
| 14 කු | | ■ | ■ | ■ |

**<u>හරහට</u>**

11. දේශීය නර්තන සම්ප්‍රදායට අයත් වාද්‍ය භාණ්ඩයකි ............................................
12. සොකරි නාට්‍ය රඟ දැක්වීම සඳහා අතීතයේ සිට භාවිතා කළ රංග භූමියකි. ..........................
13. ස්ථායි භාවය තුලින් ................................ නිෂ්පත්තිය වේ.
14. කාන්තාවන් උදෙසා වඩාත් සුදුසු ගැමි නැටුමක් ලෙස ...................... නැටුම පෙන්වා දිය හැකිය.

**<u>පහළට</u>**

15. පහතරට නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශයකි.

- නිවැරදි වචනය යොදා හිස්තැන් පුරවන්න.

16. සොකරි නාටකය ප්‍රචලිත ප්‍රදේශයක් ලෙස ........................ ප්‍රදේශය හැඳින්විය හැකිය.
17. පහතරට නර්තන සම්ප්‍රදාය ප්‍රවර්ධනයට දායක නර්තන ශිල්පියෙකු ලෙස ................................ මහතා හැඳින්විය හැකිය.
18. මාත්‍රා 4+4 අයත් අලංකාර බෙර පදයක් ලෙස ............................................ හඳුන්වාදිය හැකිය.
19. සාම්ප්‍රදායික අවනද්ධ වාද්‍ය භාණ්ඩයක් ලෙස ......................................... හැඳින්විය හැකිය.
20. චරිතයක් නිරූපනය කිරීමේදී භාව උද්දීපනය වනසේ රංගනය කිරීමට උපකාරී වන්නේ ............................................. අභිනයයි.

## II කොටස

- ❖ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ❖ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

---

01. "විවිධ චරිත නිරූපනය" යන ක්‍රියාකාරකම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(i) චරිත නිරූපනයට අදාල ප්‍රධාන මාධ්‍ය කුමක්ද? (ල.2)

(ii) එම මාධ්‍ය මූලික කරගත් තේමාවක් කෙටියෙන් සඳහන් කරන්න. (ල.2)

(iii) චරිතවල ගති ලක්ෂණයන් නිරූපනයයේදී වාද්‍ය භාණ්ඩයන්හි ප්‍රයෝජනය කෙටියෙන් සඳහන් කරන්න. (ල.2)

(iv) යොදාගත හැකි වාද්‍ය භාණ්ඩ දෙකක් නම් කරන්න. (ල.2)

(v) වාද්‍ය භාණ්ඩ දෙකක් ඇඳ පෙන්වන්න. (ල.2)

02. (i) ගැමි ගායනා වර්ග දෙකක් නම් කරන්න. (ල.4)

(ii) ගැමි නැටුම්වලදී යොදාගන්නා උපකරණ 3ක් ඇඳ පෙන්වන්න. (ල.3)

(iii) ගැමි නැටුම් දැකිය හැකි අවස්ථා තුනක් නම් කරන්න. (ල.3)

03. (i) මාත්‍රා 3+3 ට අයත් වන්නමක බෙර පදයක් ප්‍රස්තාර කරන්න. (ල.4)

(ii) මාත්‍රා 4+4 ට අයත් වන්නමක කවිපද 2 ක් ප්‍රස්තාර කර පෙන්වන්න. (ල.4)

(iii) මාත්‍රා 3 තනිතතිට අයත් කස්තිරමක් හෝ ඉරට්ටියක් ලියා දක්වන්න. (ල.2)

04. (i) රංග උපකරණයක් නිර්මාණය කිරීමේදී අවශ්‍යවන අමුද්‍රව්‍ය 4ක් නම් කරන්න.(ල.2)

(ii) රංග උපකරණ 2 ක් චිත්‍රයට නගා පෙන්වන්න. (ල.4)

(iii) නර්තන නිර්මාණයේදී ඊට ගැලපෙන රංග උපකරණයන් යොදා ගැනීමෙන් නර්තනයට කෙබඳු අලංකරණයක් ලැබේද ඔබගේ අත්දැකීම් සහිතව කෙටියෙන් විස්තර කරන්න. (ල.4)

05. පහත සඳහන් මාතෘකා අතරින් මාතෘකා 2 කට අදාළව කෙටි සටහන් ලියන්න. ( ල. 5X2)

(i) චරිත නිරූපනය

(ii) මූලික සරඹ අභ්‍යාස

(iii) වන්නම්

(iv) ජන ගී ගායනා